## පිළිතුරු පත්‍රය

01 (i) (අ) ඔක්කාක රජුගේ දූතයෝ
(ආ) මදු රජු
(ii) (අ) පවර - උතුම්
උදක් - ඒකාන්තයෙන් ම
(ආ) චන්ද්‍රයා, තමන්ගේ පැත්තක් භයංකර වූ රාහුගේ කටට හසුව තිබිය දී අනෙක් පැත්තෙන් ලෝකයාට එළිය ලබා දෙයි.
(iii) (අ) ජී. බී. සේනානායක
(ආ) දුප්පතුන් නැති ලෝකය
(iv) (අ) ඇන්ටන් චෙකොෆ්
(ආ) දයාසේන ගුණසිංහ
(v) (අ) පන්සිය පනස් ජාතක පොත
(ආ) ශක්‍ර දේවේන්ද්‍රයන් හා සීලවතී බිසව (ලකුණු 4 x 5 = 20)

02 (i) පුද්ගල ගුණ දහම් නගා සිටුවීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම (ලකුණු 05)
(ii) සිවුපද ආකෘතියෙන් රචනා වීම නිසා අත්දැකීම් රසවත්ව ඉදිරිපත් කිරීමට හැකි වී තිබේ. (ලකුණු 05)
(iii) බොරු නැත්තේ ම ය මහතුන් පැවසූ — තෙපුල
ගුණ නැණ බෙලෙන් යුතු පුතු ම ය ඉතා — ගරු
මිතුරන් නෑ කෙනෙක් නිවතුන්හට — කවුරු ආදී උචිත යෙදුම් (ලකුණු 05)

(iv) සිසුන් ලබා දී ඇති උපදේශ දෙකක් සඳහා ලකුණු පිරිනමන්න. (ලකුණු 05)
(v) විටෙක සරල බස් වහර යොදා ගනී.
බොරු නැත්තෙ ම ය මහතුන් පැවසූ — තෙපුල
පින් මද පුතුන් සියයක් ලදුවත් — නිසරු ආදී...
තවත් විටෙක වියත් වහරට සමීප බස් වහරකි
සැලෙතත් සුනෙර පවනින් සෙදෙතත් — අතල
තුමුල බලැති ගිජිඳකු මිස අන් — කෙවත ආදී උචිත යෙදුම්
ව්‍යංග්‍යාර්ථවත් ය. (ලකුණු 25)

03 (i) පබාවතිය වෙනුවෙන්
(ii) මාලාකාරයා ඇසුරින් පබාවතිය මුණගැසීමට
(iii) "එ තෙම අතවැස්සෙක් නොවෙයි. තොපට ඇදුරුකමට නිසි ය. ඔහුගෙන් මල් ගෙතීම් ඉගෙන ගනුව."
(iv) බෝධිසත්ත්වයන් අතවැස්සකු නොවන බවත්, මල්කරුවාට ඔහුගෙන් මල් ගෙතීම ඉගෙන ගන්නා ලෙසත් පැවසීමත්, බෝසතුන් විසින් ගොතන ලද මල් දම් තම දරුවන්ට ලබා දෙන ලෙසත් මින් මතුවට ඔහු ලවා ම මල් දම් ගොතන ලෙසත් පවසා රජු මසු දහසක් තෑගී ලෙස ලබා දුන් බව පැහැදිලි කර තිබිය යුතුය. (ලකුණු 25)

නැතහොත්

(i) කුරිරු ඝෝර සර්පයන්ගේ දළ කෙළවර විෂ ඇත. මදුරු මැසි සමූහයාගේ තුඩ කෙළවර විෂ ඇත. රෞද්‍ර ගෝනුස්සන්ගේ වලිගය අග විෂ ඇත.
(ii) ඔවුනට මඳ ගුණයක් කළ ද එය තදින් මතකයේ තබා ගනී. අප්‍රමාණ ගුණ නුවණ ඇති උතුමෝ කෙළවරක් නැති හිරුහැර වලට පාත්‍ර වූවත් දුෂ්ට සිතක් ඇතකර නොගනිති.
(iii) විටෙක සරල බස් වහරක් යොදා ගනී. තවත් විටෙක වියත් වහර යොදා ගනිති. ව්‍යංග්‍යාර්ථවත් ය. (නිදසුන් සපයා තිබිය යුතුය.)
(iv) සුදනන් හා දුදනන් හඳුනා ගැනීමට හැකි ආකාරයත්, නැණවතුන් හා ඉසුරුමත්, දුප්පතුන් ආදීන්ගේ ස්වාභාවය තුළින් සර්වකාලීන වටිනාකමකින් යුත් සාරධර්ම වැපිරීමට කවියාට හැකි වී ඇති බව නිදසුන් දක්වමින් පහදා තිබිය යුතු ය. (ලකුණු 25 යි)

4, 5, 6, 7 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයක් සඳහා නිදසුන් 03 ක් සඳහා ලකුණු 03
සමස්ත විස්තරයට ලකුණු 12
මුළු ලකුණු 15 බැගින්